පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සති පාසල

විෂය:- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

සතිය :

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

Department of Education, Sabaragamuwa Province/ Weekly School

## පාඩම :- ව්‍යාපාර සංවිධාන

01.

I. අ. ව්‍යාපාර සංවිධානයක් යනු කුමක් ද යන්න කෙටියෙන් නිර්වචනය කරන්න.

ආ. ලෝකයේ ව්‍යාපාර විවිධ ආකාරයට සංවිධානය වී ඇති අතර, ඒ අතරින් බහුලව දක්නට ලැබෙන ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ ක්‍රම 03ක් දක්වන්න.

(ලකුණු 02)

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන ලෙස වර්ග දෙකකි.

ආ. රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයක් ලෙස සමූපකාර ව්‍යාපාරය හැඳින්විය හැකි ය.

ඉ. ව්‍යාපාර සැම විටම ලාභ අරමුණු කරගෙන කටයුතු කරයි.

ඊ. හවුල් ව්‍යාපාරයක සාමාජික සංඛ්‍යාව අවම 02 හා උපරිම 20 ලෙස තීරණය කර ඇත්තේ හවුල් ව්‍යාපාර ආඥා පනතට අනුව ය.

(ලකුණු 02)

III. අ. තනි පුද්ගල ව්‍යාපාරයකට සාපේක්ෂව හවුල් ව්‍යාපාරයක දැකිය හැකි වාසි 02ක් සඳහන් කරන්න.

ආ. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය ඩිලාන් සහ ඩේවිඩ් යන අය පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන පුද්ගලයන් වෙති. විශ්‍රාම ගිය පසු ඔවුන් විසින් හරිත සුරකිමු නමින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට උත්සාහ කරයි.

1. මොවුන් විසින් ආරම්භ කිරීමට සුදුසු ව්‍යාපාර සංවිධානය විය යුත්තේ කුමක් ද?
2. ඉහත ආකාරයේ ව්‍යාපාර සංවිධානයක් ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන මොනවාද?

(ලකුණු 02)

IV. අ. අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂව සංස්ථාපිත සමාගම්වලට අදාළ වූ සුවිශේෂී ලක්ෂණ දක්නට ඇත. මෙම ප්‍රකාශයට අනුව එවැනි ප්‍රධාන ලක්ෂණ 4 ක් දක්වන්න.

ආ. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ඇති ව්‍යාපාර ආයතන කිහිපයක් වේ.

- ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව
- අරලිය සහල් අලෙවි සැල
- කස්තුරි ආරච්චි සහ පුත්‍රයෝ
- ලංකා පොහොර ලේකම් කාර්යාලය

1. ඉහත එක් එක් ව්‍යාපාර ආයතන අයත් ව්‍යාපාර සංවිධාන වර්ගය දක්වන්න.
2. ඉහත එම ව්‍යාපාර හිමිකාරිත්වය අනුව වර්ගීකරණය කර දක්වන්න. (ලකුණු 02 )